# ඇෆ්ගනිස්ථානයේ දී මියගිය ප්‍රථම බ්‍රිතාන්‍ය සොල්දාදුවා - කිට්

## (ජොනතන් කිතුලෙගොඩ)


**දැ**නට සති තුනකට පෙර ලන්ඩන් ඊව්නිං ස්ටෑන්ඩ්ර්ඩ් පුවත්පත ඇෆ්ගනිස්ථානයේ යුද සේවයට යොදවා සිටින බ්‍රිතාන්‍ය හමුදාවන් මුහුණ දෙන ඉරණම පිළිබඳ එම පත්‍රයේ ප්‍රධාන දේශපාලන වාර්තාකරු විසින් ලියන ලද ලිපි පෙළක් පළ කළාය. ඔහු පෙන්නා දෙන්නේ ඇෆ්ගනිස්ථානයට ගොස් සිටින සියළු යුරෝපීය රටවල හමුදා අතුරෙන් වැඩිම මරණ සංඛ්‍යාවකට මුහුණ දී ඇත්තේ බ්‍රිතාන්‍ය භට පිරිස් බවයි. මේ මස පළවෙනිදා වන විට රජයෙන් ලැබුණු සංඛ්‍යා අනුව මියගිය බ්‍රිතාන්‍ය හමුදා භටයින්ගේ ගණන **356** ක් වන අතර යුරෝපයේ අන් සියළු රටවලට අයත් භටයින්ට වූ මරණ එකතුව **298** කි. බ්‍රිතාන්‍ය හමුදාවන් පිටරටක යුද්ධයකට අත දැමීමෙන් අත්කර ගන්නා විපත එයින් පැහැදිලි වෙයි.

බ්‍රිතාන්‍ය ආරක්ෂක අමාත්‍යංශ තොරතුරු වලට අනුව ඇෆගනිස්ථානයේදී මියගිය ප්‍රථම බ්‍රිතාන්‍ය සොල්දාදුවා වන්නේ රයිෆල් බලකායට අයත් ජොනතන් කිතුලේගොඩය. ඔහුගේ මරණය සිදුවූයේ 2004 ජනවාරි මස 28 දාය. මේ නොබෝදා වූ අළුත්ම මරණය එනම් 356 වන තැනැත්තා 2011 පෙබරවාරි 9 දින මියගිය කොන්රාඩ් ලූවිස් නම් භටයා ය.

එංගලන්තයේ බෙඩ්ෆර්ඩ්ෂයර් හි වෙසෙන ශ්‍රීලාංකික යුවළකගේ පුතෙකු වන ජොනතන් මිය යනවිට 23 වන වියේ පසු විය. ප්ලිමත් විශ්වවිද්‍යාලයෙන් නාවික ඉන්ජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ඔහු ලබා සිටියේය. හමුදා සේවය ප්‍රිය කළ ජොනතන් ස්වේච්ඡා භටයෙකු ලෙස බැඳී මනා පුහුණුවක් ලබා තිබුණි. ඇෆ්ගනිස්ථානයේ සේවයට ගොස් වැඩි කලක් ගතවුණේ නැත. කාබුල් නගරයේ නැටෝ ජාත්‍යන්තර හමුදා සමග සේවයේ නියුක්ත වූ ඔහු මෙදින පදවාගෙන ගිය හමුදා ලෑන්ඩ් රෝවර් රථය ළඟින්ම ගැවෙමින් ගිය තවත් රථයක සිටි මරාගෙන මැරෙන අයෙක් පුපුරවා හැරි බෝම්බයෙන් ජොනතන් ගේ රථය පිපිරී මරණය සිදු වූ බව කියති.

ජොනතන්ගේ මරණයෙන් හෙළි වූ තවත් කරුණක් නම් ඒ අතිශය අනතරාදායක පරිසරයේ සේවය කරන බ්‍රිතාන්‍ය හමුදාවන් වෙඩි නොවදින හා පිපිරීම් වලට ඔරොත්තු දෙන රථ ඉල්ලද්දීත් රජයෙන් ඒවා යවා නැති බවයි. එසේ වී නම් ජොනතන්ගේ මරණය සිදුනොවන බව හමුදා නිලධාරීහුම පෙන්වා දුන්හ. මේ අනුව ජොනතන්ගේ පියාවන රන්ජිත් කිතුලෙගොඩ සහ මව සූසන් තම පුතාගේ මරණය පිළිබඳ සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වන ලෙස බ්‍රිතාන්‍ය රජයෙන් ඉල්ලා සිටියහ. පාර්ලිමේන්තුවේද මැති ඇමතිවරු හමුදාවට අවශ්‍ය උපකරණ ලබා නොදීම ගැන ආරක්ෂක අමාත්‍යංශයට දොස් කියන්නට වූහ. එහි ප්‍රතිපලයක් ලෙස පසුව වෙඩි නොවදින රථ ඇෆ්ගනිස්ථායට යවා ඇත. ඒ වන විට සියල්ල සිදුවී හමාරය.

කිට් යන හිතෛෂී නාමයෙන් ජෙනතන්ගේ මිතුරෝ ඔහු හඳුන්වති. තරුණවියේ දොරකඩම සිටි ඔහු අකාලයේ නැති වී ගියේය. එය මොන තරම් අවාසනාවක් ද!




## Jonathan Kithulegoda (KIT)

# The first British soldier died in Afghanistan

Recently the London Evening Standard newspaper published a series of artcles by its Chief Political Correspondent Nicholas Cecil about the plight of the British troops fighting in Afganistan. He pointed out that British soldiers pay the heaviest price and the death toll is higher than all other EU allies combined. Last month the UK military death toll came to 356 - compared to 298 for all other EU countries.

According to reports Pte Jonathan Kitulagoda of the Rifle Volunteers, who died 0n 28.01.2004 was the first British battlefield casualty, Pte Conrad Lewis, of 3 Para, died on 09.02.2011 is among the most recent.

Private Jonathan Kitulagoda, who died on 28 January, 2004, aged 23, was killed in an apparent suicide bomb attack while on peacekeeping duties in Afghanistan. He had served for only a short while, after graduating from Plymouth University with a degree in marine navigation.

Described as "cheerful," he was committed to finding peace for Afghani civilians and had a "full and professional" role as a Territorial Army infantryman.

He was a member of the Rifle Volunteers, a Territorial Army battalion, and had won many trophies for his cadet duties before he joined the Army.

Jonathan, son of Ranjith Kitulegoda and Susan Kitulegoda, was born in Bedford and grew up in Clifton, Bedfordshire. He joined the cadet force at a young age, which was when he won his trophies, one of which was for "Best Cadet" in 1997. After completing his three-year degree, during which he was already a member of the Territorial Army, he joined the Rifle Volunteers, based at Wyvern Barracks, Exeter, in 2003.

He was serving at a military base in Kabul with the Nato-led International Security Assistance Force (ISAF), when what was described by the Ministry of Defence as an "apparent suicide bomb attack" claimed his life and injured four other soldiers.

Later it was revealed that at the time of the attack, Jonathan was travelling in an Army Land Rover with soft canvas top and sides. The suicide bomber driving a taxi had detonated the 200 lb of explosives just as Kitulagoda was overtaking the vehicle driven by the bomber.

Soon after Jonathan's death, his father Ranjith Kitulegoda and mother Susan had demanded an immediate inquiry into their son's death. from the Ministry of Defence.(MOD)

The inquiry demand came soon after it was learnt that the Defence Ministry had declined to accede to requests for armoured vehicles to be provided to this particular unit working as peacekeepers in Afghanistan.


Jonathan was fondly called - Kit, by his university friends and colleagues in the forces. They are all saddened by his untimely death.

After Jonatha's death only, British government sent the requested armoured vehicles to Afganisthan.

A top officer from British Army Headquarters said: " It's not possible to say if Pte. Kitulagoda would have survived had he been in an armoured Land Rover, but his chances would have been much better."

♦ *Venura*

# මගේ මතක පොතෙන්



**ශ්‍රී** ලංකාවේ අසහාය මහා ගාන්ධර්වයන් වන විශාරද අමරදේවයන් යුරෝපයට පැමිණි ප්‍රථම වතාව වූ 1982 වර්ෂයේ ලන්ඩන් නගරයේ පැවති ඔහුගේ ගායන ප්‍රසංග පිළිබඳව මම මෙයට කලින් ලංකා විත්තියෙහි විස්තර කළා ඔබට මතක ඇත. **එක්සත් රාජධානියේ සිංහළ සංගමය** විසින් සංවිධානය කරන ලද **අමර ගී සර** ප්‍රසංග දෙකක් ඉතා සාර්ථක ලෙස ලන්ඩනයේ වේදිකා ගතවිය.

අමරදේවයන්ගේ සංගීතඥානය හා ගායනා මහිමය සේම ඔහුගේ සාමාන්‍ය ජීවිතයේ හැසිරීම කතා බහ සහ වාග් මාලා ප්‍රිය ජනකය. කාලයක් පුරා හොඳින් දන්නා කෙනෙකු වේවා එමොහොතෙහි දැක හඳුනාගත් කෙනෙකු හෝ වේවා එතුමන් ඒ සෑම කෙනෙකු කෙරෙහි දක්වන සුහදත්වය එක හා සමාන ය.

ලන්ඩනයේ ප්‍රසංග පැවති සමයේ අමරදේවයන්ට ද ඒ පැමිණි පිරිසට ද ලැබුණු ප්‍රිය සම්භාෂණ ආරාධනා සිය ගණනකි. ඇතැම් තැනකදී ඒ සත්කාරක නිවසෙන් ගීයක් ගයන්නැයි අමරදේවයන්ට ඉල්ලීමක් කරයි. බැහැයි නොකියන අමරදේව මහතා ඉතා කැමැත්තෙන් ඒ නිවැසියන්ට ගී කීපයකින්ම සංග්‍රහ කරයි. මේ එක් නිවසකදී ලැබුණු ආරාධනයකි. වයලීන වාදක ඩී. ඩී. ගුණසේන අමරදේවයන්ට මයික්‍රෝපෝනය අල්ලා ගෙන සිටියි. විජේරත්න රණතුංග තබ්ලාව වයයි. මම (මැද) ඒ මියුරු හඬ දිගේ ඈත ලොවකට ගොස් සිටිමි.

♦ *දයා ආනන්ද*

